# කොසොල් රජතුමා දුටු සිහින දහසයෙහි නූතන සමාජ යථාර්ථය

කේ. වයි. කමනී කාරියවසම්[1]

රහතන් වහන්සේට හැර අන් සෑම පෘථග්ජන පුද්ගලයෙකුටම නින්දේදී සිහින පෙනීම අනිවාර්ය වූවකි. නින්දේදී සිහින පෙනීම උදෙසා හේතු සාධක රැසක් බලපාන බව නූතන වෛද්‍ය විද්‍යාව ද පෙන්වා දී ඇති අතර පුද්ගලයාගේ අවිඥ්ඥාණික ආශයන් හඳුනා ගැනීම සඳහා සිහින බෙහෙවින් මහෝපකාරී වන බව ප්‍රොයිඩියානු මනෝ විශ්ලේෂණවාදීන් ද පෙන්වා දී ඇත. ඇතැම් පුද්ගලයන්ට අනාගතයේ සිදුවීමට නියමිත සංසිද්ධීන් පවා සිහින මගින් පෙන්වා දෙන අවස්ථා දැකගත හැකිය.මෙසේ පුද්ගලයාට නින්දේදී දර්ශනය වන සිහින මගින් බොහෝ දේ පැවසෙන බව බුද්ධ කාලයට පෙර පටන්ම ජන සමාජය තුළ පැවත එන මතයකි. මහ බෝසතුන් මව් කුස තුළ පිළිසිඳගත් අවස්ථාවේ ඒ බවද සිදුහත් බෝසතුන් තමා බුද්ධත්වය ලබන බවද නිශ්චිත වශයෙන්ම දැනගනු ලැබුවේ සිහින මගිනි.

බෞද්ධ සාහිත්‍යයේ සුප්‍රකට කොසොල් රජතුමා දුටු සිහින දහසය අනාගතය පිළිබඳ ඉතා ගැඹුරු අරුතක් ප්‍රකට කරවන්නක් බව එම සිහින විග්‍රහ කළ බුදුන් වහන්සේ විසින් පෙන්වා දෙන ලදී. රජු ඉමහත් බියට පත් කරවන්නට සමත් වූ එම සිහින හා වත්මන් සමාජ තත්වය පිළිබඳ මෙතෙක් කිසිවකුගේ අවධානයට ලක් වී නැත.ඒ අනුව අධාර්මිෂ්ට නපුරු පාලකයන් බිහිවී ඔවුහු ජනතාවට විශාල කරදර සිදු කරනු නියත බවත් , බොහෝ අසම්මත ක්‍රියා හා සාරධර්ම පිරිහුණු සමාජයක් බිහිවන බවත් පෙන්වා දුන් බුදුන් වහන්සේගේ ප්‍රකාශය හා නූතන සමාජ තත්වය සැලකිල්ලට ගෙන බැලුවිට කොසොල් රජු දුටු සිහින ඉතා හොඳින් වත්මන් සමාජය තුළ දැකගත හැක.

**ප්‍රමුඛ පද :** සිහින, නින්ද, සමාජ, පුද්ගලයා, අනාගතය

1 ගෞරව ශාස්ත්‍රවේදී උපාධි අපේක්ෂිකා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
Sampath.thiyuth@gmail.com